# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2024 අංක 10 දරන හදට හද භාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 19 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 පෙබරවාරි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 24.00 | **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2024 අංක 10 දරන හදට හද භාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී.) 2/2019

### හදට හද භාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"හදට හද භාර අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන භාර අරමුදලක්, එකී භාර අරමුදලේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී භාර අරමුදල සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. මාලිනී සේනානායක විසින් ලියා අත්සන් කරන ලද 2014 දෙසැම්බර් මස 1 වන දිනැති අංක 309 දරන භාර ඔප්පුව මගින් මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: — පූර්විකාව

එකී භාර අරමුදල පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී භාර අරමුදල විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී භාර අරමුදල සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2024 අංක 10 දරන හදට හද භාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "භාර අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) හදට හද භාර අරමුදලේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයට මින්මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "හදට හද භාර අරමුදල" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාපිත මණ්ඩලයට ඇත්තේ ය. — හදට හද භාර අරමුදල සංස්ථාගත කිරීම

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ කර ගත යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

3. (1) සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, යම් අදාළ ලිඛිත නීතියකට යටත්ව එකී නීතියෙන් අවසර දී ඇති තාක් දුරට එම පොදු පරමාර්ථ—

(අ) දේශන, සම්මන්ත්‍රණ සහ වෙනත් අදාළ වැඩසටහන් සංවිධානය කිරීම මගින්, හෘද රෝගවලට හේතු සහ ඒවා වැළැක්වීම ඇතුළුව හෘද රෝගවලට අදාළ සියලු කාරණා පිළිබඳ මහජනතාවගේ දැනුවත්කම ප්‍රවර්ධනය කිරීම; සහ

(ආ) ශ්‍රී ලංකාවේ රෝහලකින් ප්‍රතිකාර ලබා ගැනීමට අරමුදල් අවශ්‍ය වන හෘද රෝගීන්ට මූල්‍ය සහය සැපයීම,

විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ දී, වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී-පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ එවැනි කවර වූ හේතුවක් මත පදනම්ව කිසිදු වෙනස්කමකට භාජනය නොකර ක්‍රියාත්මක කරන බව සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමඟ ගැටුමක් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

4. සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු සහ රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව කරගෙන යන්නා වූ යම් කටයුතු අතර කිසිදු ගැටුමක් ඇති නොවීන යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධාන සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් ධුරදරන නිලධරයන් සංඛ්‍යාවකින් සමන්විත භාරකාර මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ භාර අරමුදලේ ධුරදරන භාරකාර මණ්ඩලය මේ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළමු වන භාරකාර මණ්ඩලය පත් කරගනු ලබන තෙක් හෝ තෝරා පත් කරගනු ලබන තෙක් සංස්ථාපිත මණ්ඩලයේ අතුරු භාරකාර මණ්ඩලය ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අතුරු භාරකාර මණ්ඩලයට, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමේ බලය තිබිය යුතු ය.

(ඇ) අතුරු භාරකාර මණ්ඩලයේ යම් තීරණයක් එහි පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය විසින් ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට වසරක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ පළමු වන භාරකාර මණ්ඩලය පත් කරනු ලැබිය යුතු ය; නැතහොත් තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(3) (අ) අනුශාසකවරයන් සහ උපදේශකවරයන් ඇතුළුව භාරකාර මණ්ඩලයේ සෑම ධුර දරන්නකු ම වසර තුනක කාලසීමාවක් සඳහා පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු අතර එකී වසර තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එවැනි යම් ධුර දරන්නකු ම, අනුශාසකවරයකු ම හෝ උපදේශකවරයකු ම නැවත පත්කර ගැනීම හෝ නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) ධුර දරන්නකු මියයෑම, ඉල්ලා අස්වීම, අශක්නුතාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, භාරකාර මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) වන ඡේදය යටතේ තෝරා පත්කර ගනු හෝ පත්කර ගනු ලබන තැනැත්තා විසින්, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව–

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව භාරකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි සෘජුවම හෝ තත් කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් එවැනි සියලු කොන්ත්‍රාත්තුවලට හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා ඇප සහිතව හෝ රහිතව අරමුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත සිදු කරනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, භාරකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ යම් නිශ්චල හෝ පෞද්ගලික දේපළ භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) පනතේ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීති ප්‍රකාර, සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන්ට යම් වැටුප්, දීමනා හා පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය සහ විදේශීය ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම; සහ

(ඔ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ අත්පත් කර ගැනීම සඳහා මේ පනත මගින් බලය දෙන ලද යම් සියලු ක්‍රියා සහ දේවල් සිදු කිරීම,

ඇතුළුව සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ වැඩිදුරටත් දියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන පරිදි එවැනි සියලු ක්‍රියා සහ කාරණා කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාපිත මණ්ඩලයට බලතල තිබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමක දී සහ ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා, කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු යː-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපා හැරීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) භාරකාර මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම හෝ ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත්කිරීම් නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය සහ කාර්ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ සහ භාරකාර මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ එකී රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ගණ පූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) භාරකාර මණ්ඩලයේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා වන සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටුකර ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම පිළිබඳ.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයකින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීති, ඒ රීති සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු අතර, *ගැසට් පත්‍රයේ* සඳහන් දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද සෑම රීතියක් ම, *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් රීතියක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එකී අනනුමතයේ දින සිට අවලංගු වූ ලෙස සළකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ එසේ යම් රීතියක් අවලංගු කරන ලදැයි සළකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

(6) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සියලු අවස්ථාවන් හි දී, සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

**8.** භාරකාර මණ්ඩලය විසින්, සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය. සාමාජික නාමලේඛනය

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලය වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල්, 6(ඇ) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව භාරකාර මණ්ඩලය විසින් අනුමත කළ බැංකුවක හෝ ඊට වැඩි බැංකු සංඛ්‍යාවක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කළ යුතු ය.

(3) මේ පනත යටතේ සංස්ථාපිත මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා හෝ එම සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තකු; හෝ

(ආ) එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තා

**11.** (1) භාරකාර මණ්ඩලය විසින්, එක් එක් මුදල් වර්ෂය සඳහා සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මසක් ඉකුත් වීමට පෙර, විගණකාධිපතිවරයා විසින් හෝ සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කළ විගණනය

කරන ලද ගිණුම් ප්‍රකාශය ද සමග එම වාර්තාව සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාට භාර දිය යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ සංස්ථාපිත මණ්ඩලය වෙත විදේශීය හා දේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙන ම ගිණුම් ප්‍රකාශයක්, (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග ඇමිණිය යුතු ය.

භාර අරමුදල විසින් ගෙවිය යුතු සහ භාර අරමුදලට අයවිය යුතු ණය

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී භාර අරමුදල විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර, එදිනට භාර අරමුදලට අයවිය යුතු සියලු ණය සහ භාර අරමුදලට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**13.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය තිබිය යුතු ය. එසේ ම, එවැනි සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමට බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා ම පමණක් අදාළ කරගත යුතු අතර, ඉන් කිසිදු කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් කවර හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ඍජුව හෝ වක්‍රව ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**15.** (1) භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව කිසියම් සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට

සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි භාරකාර මණ්ඩලයේ ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් වන්නා වූ ද වෙනත් ආයතනයකට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**17.** මේ පනතේ ඇතුළත් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් සංස්ථාපිත මණ්ඩලයක අයිතිවාසිකම්වලට හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අර්ථ නිරූපණය

**18.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභී බැංකුවක් අදහස් වේ;

"නීතිය" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය; සහ

"ලිඛිත නීතිය" යන්නෙන්, යම් කිසි නීතියක් සහ අනු නීතියක් අදහස් වන අතර, පළාත් සභාවක් විසින් සාදන ලද ප්‍රඥප්ති සහ එම ප්‍රඥප්ති යටතේ සාදන ලද නියෝග, යම් නීතියක් යටතේ නියම, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා

සහ නියෝග සෑදීමට හෝ නිකුත් කිරීමට බලය හෝ අධිකාරය ඇති යම් මණ්ඩලයක් හෝ තැනැත්තකු විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද නියම, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා සහ නියෝග ඊට ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල, භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.